www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ඝාතනය පිලිබඳ නොවිසඳුනු ගැටලු

## Unanswered questions about Sri Lankan foreign minister's assassination

**ඩබ්ලිව්. ඒ. සුනිල් සහ කේ. රත්නායක විසිනි**
**2005 අගෝස්තු 26**

අගෝස්තු 12 දා රාත්‍රියේ ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් කොලඹ සිය පුද්ගලික නිවහනේ දී දුරස්ථ තුවක්කුකරුවකු විසින් වෙඩි තබා ඝාතනය කිරීමෙන් පසුව දැන් සති දෙකක් ගත වී ඇත.

ශ්‍රී ලංකාවේ මාධ්‍යවලට හා දේශපාලන පක්ෂවලට නම්, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය මෙම ඝාතනය සිදු කල බවට කිසිදු සැකයක් නැත. ඝාතනයෙන් පැය කිහිපයක් ඇතුලත ජ්‍යෙෂ්ට පොලිස් නිලධාරින් හා මිලිටරි ප්‍රකාශකයන් නිවේදනය කලේ එල්ටීටීඊය එයට වගකිව යුතු බව යි.

ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය ඇතුලු සිංහල ස්වෝත්තමවාදී පක්ෂ, වහාම ඝාතනය ඩැහැ ගෙන එල්ටීටීඊය සමග දැන් පවත්නා සටන් විරාමය හෙලා දැක යලි යුද්ධය කරා යාමට සම වන ඉල්ලීම් මත උද්ඝෝෂනයක් දියත් කලහ. සිය උද්ඝෝෂනයේ කොටසක් ලෙස, ඔවුහු, එල්ටීටීඊය ඝාතකයන් ලෙස නම් කිරීමට අපොහොසත් වන සියල්ලන් ම හෙලා දැක තිබේ.

කොලඹ පුවත් පත් කදිරගාමර්ගේ ඝාතකයන් හා පොලිස් පරීක්ෂන පිලිබඳ "විශ්ලේෂනයන්ගෙන්" හා කතාන්දරවලින් පිරී තිබේ. ඒවායින් බොහොමයක් ම හුදු ගොතන ලද ඒවා ය. ඒවා සියල්ල ම ආරම්භ වන්නේ, ඝාතනය පිලිබඳ වගකීම ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කර ඇති එල්ටීටීඊය වරදකරුවන් බවට උපකල්පනය කිරීමෙනි. වෙනත් විකල්පයක් පරීක්ෂාවට ලක් කිරීම වත් සිදු කොට නැත.

එල්ටීටීඊය මෙම ඝාතනය සඳහා අන දී ඇත යන්න විය හැකි දෙයකි. ඔවුන්ට සටන් විරාමයෙන් ලැබුනු දෙයක් නැති තරම් ය. 2003 සිට සාම සාකච්ඡා ඇන හිට ඇති අතර කොලඹ පාලනය සමග ඒකාබද්ධ සුනාමි ආධාර යාන්ත්‍රනයක් ගොඩනගා ගැනීමේ ප්‍රයත්නයන් නැවත නැවතත් ප්‍රමාද කෙරී ඇත. නැගෙනහිර පලාතේ දී, ඔවුන්ගේ නිලධාරින්, කාර්යාල සහ සටන්කරුවෝ, ශ්‍රී ලංකා මිලිටරියේ අව්‍යාජ සහාය ලබන එල්ටීටීඊයෙන් කැඩී ගිය කන්ඩායමක නිරන්තර ප්‍රහාරයන්ට ලක්ව ඇත.

කෙසේ වෙතත්, කදිරගාමර් ඝාතනයෙන් මූලික වාසිය ලබා ගෙන ඇත්තේ, ආධාර ගිවිසුමට, සටන් විරාමයට හා සමස්ත "සාම ක්‍රියාදාමයට" ම දෘඩතර ලෙස විරුද්ධව සිටින ජවිපෙ, හෙල උරුමය සහ ආරක්ෂක හමුදාවල කොටස් ය. මෙම ප්‍රතිගාමී ස්ථරවලට අයත් කොටස් සාම සාකච්ඡා යලි ඇරඹීමේ මොන යම් හෝ ප්‍රයත්නයක් විස ගැන්වීමට හැකි වන පරිදි කදිරගාමර් ඝාතනය කිරීමට කුමන්ත්‍රනයක් අටවා එල්ටීටීඊය මත වරද පැටවීමක් සිදු වීමට බෙහෙවින් ඉඩ තිබේ.

කොලඹ කිසිවෙක් මෙම හැකියාව මතු කිරීම වත් සිදු කොට නැති තරම් ය. එල්ටීටීඊයට එරෙහි ඝෝෂාව සමග පෙල ගැසීමට පෙර ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ඝාතනය සම්බන්ධයෙන් බැන වැදුනේ "ගැටුම සාමකාමී ලෙස විසඳාගැනීමකට විරුද්ධ දේශපාලන සතුරන්ට" ය. මෙම ප්‍රකාශය විශේෂ අර්ථභාරයක් දරන්නේ, මිලිටරිය ඇතුලත මුල්බැසගත් විරුද්ධත්වය මෙන් ම එල්ටීටීඊය සමග ආධාර ගිවිසුමක් අත්සන් කිරීමේ ඇයගේ තීන්දුව හේතු කොට ගෙන ජූනි මස පාලක සභාගයෙන් ඉවත් වූ ජවිපෙ දක්වන සතුරු භාවය ද ජනාධිපති මැනවින් දන්නා නිසා ය.

කුමාරතුංගගේ අංශක 180ක හැරීමට හේතු වූ කරුනු ද එමෙන් ම අර්ථභාරී ය. පසුගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් පත්‍රය තුල, ඉහල පෙලේ දේශපාලන සබඳතා පවතින පුවත් පතේ දේශපාලන සංස්කාරක එලිදරව් කොට තිබූ පරිදි, කුමාරතුංග එල්ටීටීඊය මත වරද පැටවීමට අපොහොසත් වීම සම්බන්ධයෙන්, තිරයෙන් පිටුපස සිට ජවිපෙයෙන් එල්ල වූ, තියුනු විවේචනයකට මුහුන දුන්නා ය. "මම කොහොමද එල්ටීටීඊයට වරද පටවන්නෙ? මම ජනාධිපති. එවැනි දෙයක් ප්‍රකාශ කිරීමට පෙර මට සාක්ෂි තිබිය යුතු යි." කුපිත වූ කුමාරතුංග සිය ඇමති සගයකුට පැවසුවා ය. නමුත් එදින ම සැඳෑවේ (අගොස්තු 14) ඇය ජාතික රූපවාහිනියේ පෙනී සිට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමෙන් තොරව, එල්ටීටීඊය ඝාතනයට වගකිව යුතු යැයි ප්‍රකාශ කලා ය.

ඝාතනයෙන් අනතුරුව වහාම පොලීසිය නිවේදනය කලේ, ඊට දෙසතියකට පෙර කදිරගාමර්ගේ නිවස අසල වීඩියෝ කැමරාවක් අතැතිව ඔත්තු බැලීමේ යෙදී සිටි දෙමල ජාතිකයන් දෙදෙනකු -- "එල්ටීටීඊ සැකකරුවන්" -- තමන් රඳවා ගෙන ඇති බව යි. එතැන් පටන් මේ දක්වා, එල්ටීටීඊය ඝාතනය සිදු කල බව ඔප්පු කිරීමට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට පොලිස් පරීක්ෂනය සමත්ව නැත. ඉදිරිපත් කර ඇති සීමිත "සාක්ෂි" පරිවේෂනීය හා අවිනිශ්චිත වන අතර ඒවා ගැටලු විසඳාලනවා වෙනුවට තවත් ගැටලු මතු කරයි. ඝාතකයා හෝ ඝාතකයන් අත් අඩංගුවට ගෙන නැත. එපමනක් නොව, පෙනී යන පරිදි පොලීසිය සොයා ගෙන ඇත්තේ හෝඩුවාවල් කිහිපයකි.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, කොලඹ අපරාධ අංශයේ අධ්‍යක්ෂ සහ පරීක්ෂක කන්ඩායමේ සාමාජිකයකු වන ජ්‍යෙෂ්ට පොලිස් අධිකාරී සරත් ලූගොඩට කතා කලේ ය. පරීක්ෂනයේ ප්‍රගතිය පිලිබඳව විමසූ කල ඔහු මෙසේ පැවසී යː "අපරාධය සිදු කල පුද්ගලයා පිලිබඳව තවමත් හෝඩුවාවක් නැත." එල්ටීටීඊය මෙයට වගකිව යුතු යැයි ඔහු විශ්වාස කරන අතර ම ලූගොඩ මෙසේ ද කීයː "පරීක්ෂනය අවසන් වන තෙක් එය (ඝාතනය) සිදු කරන ලද්දේ එල්ටීටීඊය විසින් ද නැත හොත් වෙනත් කන්ඩායමක් විසින් ද යන්න පැවසිය නො හැකි ය." 100කගෙන් පමන ප්‍රශ්න කර ඇති නමුත් කිසිවෙක් හෝ රඳවා ගෙන නැතැයි ඔහු පැවසී ය.

ප්‍රධාන මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් දයා රත්නායකට ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කතා කලේ ය. ඔහු අවධාරනය කලේ එල්ටීටීඊය කදිරගාමර් ඝාතනය කල බවට කිසිදු සැකයක් නැති බවයි. සාක්ෂි පිලිබඳව විමසූ කල "එය (එල්ටීටීඊයේ වගකීම) තහවුරු කොට නැති" බව ඔහු පිලිගති. "පරීක්ෂන සිදු කර ගෙන යන්නේ විවෘත මනසකින් යුතුව ය." යැයි ඔහු කී ය.

තථ්‍ය වසයෙන් ගත් කල, පරීක්ෂනය සිදු කර ගෙන යන්නේ "විවෘත මනසකින්" යුක්තව නම් නොවේ. මිලිටරිය, පොලීසිය හෝ විවිධ සිංහල වර්ගවාදී සංවිධාන ඝාතනයට සම්බන්ධ වීමේ හැකියාව පරීක්ෂා කිරීමට කිසිදු ප්‍රයත්නයක් දරා නැත. එල්ටීටීඊයට ඇති සම්බන්ධයක් සොයා ගැනීමේ උත්සාහයක් ලෙස, පරීක්ෂනය සඳහා අත් අඩංගුවට ගෙන ඇති සියල්ලන් ම පාහේ දෙමල ජාතිකයන් ය. එහෙත් සති දෙකක් තිස්සේ පරීක්ෂන සිදු කල මුත් ඝාතකයන් සම්බන්ධයෙන් පොලීසිය තවමත් හෝඩුවාවක් සොයා ගෙන නැත.

## සාක්ෂි නැතිකම

මෙතෙක් ප්‍රසිද්ධ වී ඇති කරුනු මත පාදක වූ කල, කදිරගාමර් ඝාතනය සම්බන්ධයෙන් නොවිසඳුනු ගැටලු බොහොමයක් පවතී. එපමනක් නොව, මාධ්‍යවලට කාන්දු කර ඇති තොරතුරුවලින් බොහොමයක් එක්කො සැක සහිත ය නැත හොත් පසුව නොමග යවන සුලු හෝ සාවද්‍ය කරුනු බවට එලිදරව් වී ඇත.

" කදිරගාමර්ට වෙඩි තබන ලද්දේ, ඔහු කොලඹ නගර මධ්‍යයේ මහේශාක්‍ය ප්‍රදේශයක් වන බුලර්ස් පටුමගේ පිහිටි ඔහුගේ නිවහනේ තටාකයක පිහිනීමේ යෙදී සිට ගොඩ ඒමෙන් පසුව රාත්‍රී 10.45ට පමන ය. ඔහුගේ ආරක්ෂක කන්ඩායමේ ප්‍රධානියා වන කපිතාන් මනතුංග මහේස්ත්‍රාත් පරීක්ෂනයට සාක්ෂි දෙමින් කියා සිටියේ, තටාකය අවට හා නිවස අසල ආරක්ෂක භටයන් පස් දෙනෙක් සිටි බවයි. තමාට වෙඩි ශබ්ද ඇසුනු බවත් තමා පෙරලා වෙඩි තබා ඉන් අනතුරුව සෙසු ආරක්ෂක භටයන් සමග ඇමතිවරයා ජාතික රෝහලට ගෙන ගිය වත් ඔහු පැවසී ය.

ඝාතකයන් අල්ලා ගැනීමට කිසිදු ප්‍රයත්නයක් නොදැරුවේ ඇයි? මනතුංග හා ආරක්ෂක භටයන් කදිරගාමර්ගේ ජීවිතය ආරක්ෂා කර ගැනීම පිලිබඳව උත්සුක වුවා විය හැකි වුනත්, සෙසු ආරක්ෂක හමුදා නිලධාරීන් කිසිදු පියවරක් නොගත්තේ ඇයි? එවන් අවස්ථාවන්හි දී, පොලීසිය හා මිලිටරිය, වාහන පරීක්ෂා කිරීමට වහාම මාර්ග බාධක ඉදි කරයි. එහෙත් රටේ ජ්‍යෙෂ්ටතම ඇමතිවරයකු ඝාතනය කිරීමෙන් පසුව, අඩු ගනනේ පැය දෙකක් යන තුරු මාර්ග බාධක ඉදි කෙරුනේ නැත." ඔහුට (ඝාතකයාට) බේරී යාමට ඇති තරම් කල් තිබුනි." යැයි ජ්‍යෙෂ්ට පොලිස් නිලධාරියෙක් සන්ඩේ අයිලන්ඩ් පත්‍රයට පැවසී ය.

" පොලීසිය එලිදරව් කල පරිදි, වෙඩි ප්‍රහාර පැමිනියේ, තටාකයේ සිට යන්තම් මීටර් 35ක් ඔබ්බෙන් පිහිටි යාබද නිවසක ඉහල මාලයේ නාන කාමරයක සිට ය. තුවක්කුකරුවා ඇලුමීනියම් බටවලින් තැනූ ත්‍රිපොඩ් එකක් මත රයිෆලයක් සවි කොට නාන කාමරයේ ජනේලයක කුඩා සිදුරක් තුලින් වෙඩි තැබී ය. රොකට් විදිනයක් භාවිතයෙන් ග්‍රෙනේඩයක් විද තිබුනත් එය පිපිරුනේ නැත. රොකට් විදිනය අසල පිහිටි පඳුරු තුල අතහැර දමා තිබී සොයා ගැනුනි. තුවක්කුකරු රයිෆලයත් රැගෙන ඔහු සමග සිටියා විය හැකි උදව්කරුවකුත් සමග පලා යාමට සමත් විය. ඝාතකයා නාන කාමරය තුල සැහෙන වේලාවක් රැඳී සිටියා විය හැකි යැයි පොලීසිය පැවසී ය.

යාබද නිවස ආරක්ෂාකාරී බවට තහවුරු කර ගැනීමට කිසිදු ප්‍රයත්නයක් නොදැරුවේ ඇයි? දශක දෙකක් තිස්සේ සිවිල් යුද්ධයක ගිලී පවතින ශ්‍රී ලංකාවට දේශපාලන ඝාතන පිලිබඳ දීර්ඝ ඉතිහාසයක් පවතී. සියලු ම ඇමතිවරුන්ට ආරක්ෂාව සපයන්නේ ඇමති ආරක්ෂක අංශයට (එම්එස්ඩී) අයත් විශේෂ පුහුනුවක් ලද භටයන් ය. තුවක්කුකරුවන් විසින් යොදා ගත

හැකි ස්ථාන පරීක්ෂාවට ලක් කිරීම ප්‍රභූ නිවාස අවට හෝ ප්‍රභූන් වාහනවල ගමන් කරන කල සාමාන්‍යයෙන් ක්‍රියාවට දමනු ලැබෙන මූලික පූර්ව-ආරක්ෂක විධික්‍රමයකි. ජනාධිපතිට හා අගමැතිට පමනක් දෙවෙනි වන ආකාරයේ ඉහල ම ආරක්ෂක ප්‍රමුඛතාවක් දී ඇති කදිරගාමර් සම්බන්ධයෙන් මෙවන් පියවර නො ගත්තේ ඇයි?

" යාබද නිවසේ හිමිකරු වන ලක්ෂ්මන් තලෙයිසිංහම් අගෝස්තු 15 දා මහේස්ත්‍රාත් පරීක්ෂනයට පැවසූ පරිදි, පොලීසිය ඔහුගේ නිවසට පැමිනියේ අගෝස්තු 13 දා අලුයම 1ත් 2ත් අතර වේලාවක ය -- එනම්, අඩු ගනනේ කදිරගාමර් ඝාතනය කිරීමෙන් පැය දෙකකට පසුව ය. පැහැදිලි ප්‍රශ්නය නම්: වෙඩි ප්‍රහාර පැමිනි නිවස පරීක්ෂා කිරීමට ඝාතනයෙන් පසුව මෙතරම් දිගු කලක් ගත්තේ ඇයි?

තලෙයිසිංහම් දෙමල ජාතිකයෙක් ය යන කරුන කොලඹ මාධ්‍ය විශල වසයෙන් උලුප්පා දක්වා ඇත. ඔහු හෝ ඔහුගේ සොහොයුරන් එල්ටීටීඊයට සම්බන්ධ බවක් පෙන්වාලීමේ ප්‍රයත්නයක් ලෙස පදනම් විරහිත කතාන්දර ප්‍රචාරය කෙරී ඇත. එක කතාවක් නම්, ඔහු වනාහි මුදල් වෙනුවෙන් එල්ටීටීඊය සමග කුමන්ත්‍රනයකට ඇදී ගිය සුරා සොඬකු බව යි. තවත් කතාවකට අනුව, ලන්ඩනයේ වෙසෙන ඔහුගේ සහෝදරයෙක් එල්ටීටීඊය වෙනුවෙන් අරමුදල් එකතු කලේ ය. තවත් කතාවකින් කියැවුනේ ඔහුගේ මෙහෙකරුවෙක් සිද්ධියට සම්බන්ධ බව යි.

තමා සිය නිවසේ ඉහල මාලය පාවිච්චි නො කල බවත් ගිලන්ව සිටින සිය බිරිඳ සමග පහල මාලයේ වාසය කල බවත් තලෙයිසිංහම් පරීක්ෂනයට පැවසී ය. තමන්ගෙන් ඉල්ලා සිටියේ නම් සිය නිවස සෝදිසි කිරීමට ආරක්ෂක හමුදාවන්ට කැමැත්තෙන්ම ඉඩ දෙන බව ද ඔහු කියා සිටියේ ය. අර්ථභාරී කරුන නම්, පොලීසිය ඔහුටත් ඔහුගේ සොහොයුරන්ටත් එරෙහිව කිසිදු පියවරක් නො ගැනීම යි. තලෙයිසිංහම්ගෙන් පැය ගනනාවක් තිස්සේ ප්‍රශ්න කිරීමෙන් පසුව නිදහස් කරන ලදි. මාධ්‍ය වාර්තාවන්ට අනුව, ඔහුගේ සොහොයුරා මෙරටට උදර්පනය කර ගන්නා ලෙස පොලීසිය ආන්ඩුවට උපදෙස් දී ඇති නමුත් ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නැත.

" පසුගිය සති අන්ගයේ *සන්ඩේ ටයිම්ස්* පත්‍රය කල එළිදරව්වකට අනුව, තමා ඝාතනය කිරීමේ සැලසුමක් පිලිබඳව රටේ මිලිටරි ඔත්තු සේවා මන්ඩලය හරහා බටහිර ඔත්තු ඒජන්සියකින් කදිරගාමර් වෙත අනතුරු ඇඟවීමක් ලැබී තිබුනි. "තනි ඡේදයක කෙටි අනතුරු ඇඟවීම කියා සිටියේ ඔහුව ඝාතනය කිරීමේ සැලසුමක් 2005 අගෝස්තුවල දී ක්‍රියාවට දැමීමට නියමිත බව යි." යැයි ලිපිය සඳහන් කලේ ය. එහෙත් දිගු කාලීන ඉල්ලීම් තිබිය දී ම, ඔහුගේ ආරක්ෂක භටකාය වර්ධනය කිරීමට කිසිදු හදිසි ක්‍රියාමාර්ගයක් ගත්තේ නැත. "අමතර ආරක්ෂක පියවර සඳහා අනුමැතිය ලැබුනේ ප්‍රථම ඉල්ලීමෙන් මාස එකොලහකට පසුව ය -- උත්ප්‍රාසාත්මක ලෙස ඔහුට ඝාතනය කල දිනයේ ය." යැයි එය තව දුරටත් කියා සිටියේ ය.

ආරක්ෂක පියවරයන්ගේ මග හැරීම පැහැදිලි කිරීමට *සන්ඩේ ටයිම්ස්* උත්සාහ කර තිබුනේ කදිරගාමර් විටින් විට කතා බස් කල "එල්ටීටීඊය සමග සමීප සබඳතා තිබූ දෙමල ව්‍යාපාරිකයකුගේ" ප්‍රකාශ වාර්තා කිරීම මගිනි. ඔහු සිය තනතුරෙන් ඉවත් වන තෙක් එල්ටීටීඊය ඔහුව ඉලක්ක කර නො ගනු ඇතැයි ඇමතිවරයාට ව්‍යාපාරිකයාගෙන් සහතිකයක් ලැබී තිබුනි. තම ආරක්ෂාව ලිහිල් කිරීමට කදිරගාමර් යොමු වූ බවට ලිපිය නිගමනය කරන නමුත් එල්ටීටීඊය හැර වෙනත් අයෙක් ඇමතිවරයා ඝාතනය කිරීමට ඇති ඉඩකඩ එය පිලිගන්නේ නැත. එපමනක් නොව, කදිරගාමර්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු අය මූලාවට ලක් වූයේ ඇයි? ඇමතිවරයා ඝාතනය කිරීමට සැලසුම කල බව කියන "බටහිර ඔත්තු ඒජන්සිය" හරියට ම කවුරුන් ද? ඔහුගේ ආරක්ෂාව ඉහල දැමීමට කිසිදු පියවරක් නොගත්තේ ඇයි?"

පොලීසිය මුලින් කියා සිටියේ ඝාතකයා ස්නයිපර් තුවක්කුවක් යොදා ගත් බව යි. කෙසේ වෙතත්, ආන්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* සහතික කොට පැවසුවේ තුවක්කුව එවැන්නක් නො වන බව යි. පොලීසිය විසින් උසාවියට ඉදිරිපත් කරන ලද පාවිච්චි කල පතරම් කොපු මගින් පෙනී යන්නේ එවන් ආයුධයක් යොදා නො ගත් බව යි. පසුගිය සති අන්තයේ රජයට අයත් *සන්ඩේ ඔබ්සවර්* පත්‍රයේ පල වූ ලිපියක් "අතිශයින් ම විශ්මයට පත්ව" ප්‍රකාශ කලේ, කදිරගාමර් ඝාතනය කර ඇත්තේ "එක්කො සන්නද්ධ සේවාවන්ගෙන් සොරකම් කරන ලද නැති නම් ආයුධ වෙලෙන්දකුගෙන් මිල දී ගන්නා ලද සබ්-මැෂින් තුවක්කුවකින්" බව යි. වෙනත් වචනවලින් කිය තොත්, කදිරගාමර් ඝාතනය කෙරුනේ විශේෂ වර්ගයේ තුවක්කුවකින් නො ව, ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන් විසින් පාවිච්චි කරනු ලබන හා රට පුරා පහසුවෙන් ලබා ගත හැකි වර්ගයේ ස්වයංක්‍රීය අවියකින් බව යි.

" අගෝස්තු 18 දා පල වූ *ඩේලි මිරර්* වාර්තාවක තවත් සාවද්‍ය තොරතුරු අඩංගු විය. පොලීසිය තලෙයිසිංහම්ගේ නිවහන අසල තිබී සයනයිඩ් කරල් දෙකක් සොයා ගෙන ඇතැයි එය කියා පෑවේ ය. සයනයිඩ් කරල් යනු එල්ටීටීඊයට අනන්‍ය සලකුනක් ය යන පැහැදිලි කරුන මතු කරන අතර ම එම ලිපිය පැහැදිලි නො කල කාරනය නම්, ඝාතකයන් එල්ටීටීඊ සාමාජිකයන් නම් ඔවුන් සයනයිඩ් කරල් එහි දමා

ගියේ ඇයි ද යන්න යි. නිසැකව ම ඔවුන් පොලීසියට හසුවීම පිලිබඳව බිය වූයේ නම් ඔවුන් සයනයිඩ් කරල් තමන් සන්තකයෙහි තබා ගන්නවා ඇත. පසුව එලිදරව් වූ අයුරු, මෙම කතාන්දරය මකුලු හුයෙන් ගොතන ලද එකක් බව පෙනී ගිය අතර එබැවින් පොලීසිය එය අතහැර දමා ඇත.

ඝාතනයෙන් ඉක්බිති මිලිටරි ප්‍රකාශක දයා රත්නායක වහාම ප්‍රකාශ කලේ, එය එල්ටීටීඊ ක්‍රියාවක "සියලු ලක්ෂන" දරන බව යි. තථ්‍ය වසයෙන් ගත් කල, කාරනාව එහි ප්‍රතිවිරුද්ධය යි. එල්ටීටීඊ ඝාතනවල "ලක්ෂන" ලෙස පැවත ඇත්තේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් මිස දුරස්ථ තුවක්කුකරුවන් නො වේ. ඉන්දියානු අගමැති රජීව් ගාන්ධි සහ ශ්‍රී ලංකාවේ ජනාධිපති රනසිංහ ප්‍රේමදාස මෙන් ම ශ්‍රී ලංකාවේ ඉහල පෙලේ ඇමතිවරු ගනනාවක් ම ඝාතනය කරන ලද්දේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් විසිනි. 1999 දී කුමාරතුංග එවන් ප්‍රහාරයකින් දිවි ගලවා ගත්තා ය. ඉහල මට්ටම් කැපවීමක් ඉල්ලා සිටින මරාගෙන මැරෙන බෝම්බකරුවන් මෙන් නො ව, එක්කො දේශපාලන හෝ නැති නම් මූල්‍යමය පෙලඹවීමක් මත ඇමතිවරයකු ඝාතනය කරනු පිනිස තුවක්කුවක කොකා ගැස්සීමට අවශ්‍ය නිපුනතාවයෙන් යුක්ත සොල්දාදුවන්, හමුදාව හැර ගිය අය, පැරාමිලිටරි භටයන් හා මැරයන් ශ්‍රී ලංකාවේ හිඟ නැත.

නොවිසඳුනු ගැටලු සියල්ල යොමු වන්නේ එක දිශාවකට ය. කදිරගාමර්ගේ ආරක්ෂාව භාරව සිටි අය කිසිදු අත්දැකීමක් නැති ආධුනිකයන් නො වේ නම්, ඇමතිවරයා මිලිටරිය හෝ පොලීසිය සම්බන්ධිත ඉහල පෙලේ කුමන්ත්‍රනයකට ගොදුරු වූවා විය හැකි ය. දශක දෙකක යුද්ධයෙන් පසුව, ආරක්ෂක හා ඔත්තු සේවා යන්ත්‍රනයේ කොටස් සිය අරමුනු සාක්ෂාත් කර ගනු වස් නො කරනු ඇති දෙයක් නැති තරම් ය. කාරනාන එය නම්, පොලිස් පරීක්ෂනවල කිසිදු ප්‍රගතියක් නැතිකම එයින් ම පැහැදිලි කෙරෙනු ඇත. එනම් රාජ්‍ය යන්ත්‍රනය තමන් ගැනම පරීක්ෂා කිරීමේ යෙදී සිටී.

ඝාතනය කවුරු සිදු කලත්, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව කඩා පනිනු පිනිස එය වහාම ඩැහැගනු ලැබ ඇත. ප්‍රධාන සංස්ථාපිත පක්ෂ සියල්ල ම පාහේ සිය උපායික මතභේද පසෙක ලා පොලීසියට හා මිලිටරියට අත් අඩංගුවට ගැනීමට හා රඳවා ගැනීමට අසාමාන්‍ය බලතල ලබා දෙන හදිසි නීති රෙගුලාසි සම්මත කර තිබේ. මාධ්‍ය වාරන පැනවීමේ ද විරෝධතා හා රැස්වීම් තහනම් කිරීමේ ද අයිතිය ජනාධිපතිට තිබේ. මෙම පියවර යොදා ගනු ලබන්නේ කදිරගාමර්ගේ ඝාතකයන් කොටු කර ගැනීමට නො වේ. අන් සියල්ලට මත් වඩා ඒවා යොදා ගනු ඇත්තේ වැඩ කරන ජනතාවට - දෙමල, සිංහල හා මුස්ලිම් -- එරෙහිව ය.

© www.wsws.org